# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.06 පැය 0830 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /660/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. නීති විරෝධී දුම්වැටි තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුර.**

2024.04.05 වන දින රාත්‍රී කාලයේ බොරැල්ල පොලිස් වසමේ වනාතමුල්ල ප්‍රදේශයේදී විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත එම නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද සිගරට් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු සහ ප්‍රවාහනය සඳහා යොදාගත් ත්‍රීරෝද රථය සමඟ අත්අඩංගුවට** ගෙන බොරැල්ල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 65 ක් වන කොළඹ 08 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බොරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අළුත්ගම විශේෂ කාර්ය බලකා කඳවුර.**

2025.04.05 වන දින සවස් කාලයේ වැලිපැන්න පොලිස් වසමේ කුරුඳුවත්ත ප්‍රදේශයේදී අළුත්ගම විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 358 මිලි ලීටර් 500 ක්, තඹ දඟරයක් සහ යකඩ බැරල් 02 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වැලිපැන්න පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 51 ක් වන නුගගහලන්ද, මීගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැලිපැන්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දඹුල්ල විශේෂ කාර්ය බලකා කඳවුර.**

2025.04.05 වන දින දහවල් කාලයේ දඹුල්ල පොලිස් වසමේ මැණික්දෙන ප්‍රදේශයේදී දඹුල්ල විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් ලීටර් 20 ක්, තඹ දඟරයක්, ප්ලාස්ටික් බූලියක් සහ යකඩ බැරල් 01 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන දඹුල්ල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 33 ක් වන මැණික්දෙන, දඹුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දඹුල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කළ සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට - පුල්මුඩේ විශේෂ කායර් බලකා කඳවුර.

2025.04.05 වන දින උදෑසන කාලයේ පුල්මුඩේ පොලිස් වසමේ පලෛලෛරක්කම් ප්‍රදේශයේදී පුල්මුඩේ විශේෂ කායර් බලකා කඳවුරේ නිලධාරීන් සහ පුල්මුඩේ පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව වැලි ගොඩ දමමින් සිටි සැකකරුවන් පස් දෙනෙකු, බෝට්ටු 05 ක් සහ උපරකණ සමඟ අත්අඩංගුවට** ගෙන පුල්මුඩේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 27, 32, 37, 42 සහ 44 වයස්වල පසුවන තිරියාය, බිංගිරිය, මාතලේ, දෙහිඕවිට සහ රත්නපුර ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

පුල්මුඩේ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. මත්පෙති සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සෙට්ටිකුලම විශේෂ කායර් බලකා කඳවුර.

2025.04.05 වන දින සවස් කාලයේ කවරක්කුලම පොලිස් වසමේ අරුණගම හන්දිය අසලදී සෙට්ටිකුලම විශේෂ කායර් බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මත්පෙති 350 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන කවරක්කුලම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 35 ක් වන අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කවරක්කුලම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 06. බලපත්‍ර නොමැතිව ඉරන ලද තේක්ක දැව සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අරන්තලාව විශේෂ කායර් බලකා කඳවුර.

2025.04.05 වන දින සවස් කාලයේ පදියතලාව පොලිස් වසමේ සේරංකඩ ප්‍රදේශයේදී අරන්තලාව විශේෂ කායර් බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව ඉරන ලද තේක්ක දැව ලෑලි 88 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන සේරංකඩ අඩවි වන කායර්ාලය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 26 වන පදියතලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සේරංකඩ අඩවි වන කායර්ාලය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 07. බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කළ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - අරලගංවිල විශේෂ කායර් බලකා කඳවුර.

2025.04.05 වන දින රාත්‍රී කාලයේ අරලගංවිල පොලිස් වසමේ නිධන්වල ප්‍රදේශයේදී අරලගංවිල විශේෂ කායර් බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු සමඟ වැලි කියුබ් 03 සහ 04 ක් පුරවන**

**ලද ලොරි රථ දෙකක් අත්අඩංගුවට** ගෙන අරලගංවිල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 32 සහ 34 වයස්වල පසුවන අරලගංවිල සහ පොළොන්නරුව ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අරලගංවිල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**